ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2005/2006

අපරාධ නීතිය - LWU 2312

කාලය - පැය තුනයි.

---

දිනය - 2006.03.22 වේලාව - ප.ව.01.30 -පව.04.30 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

*ප්‍රශ්න <u>පහකට</u> පමණක් පිළිතුරු සපයන්න.*

01. විදේශිකයෙකු වන හෙන්කල් මහතා දීර්ඝ කාලයක සිට ශ්‍රී ලංකාවේ වාසය කරමින් සිටියි. ඔහු අන්තර්ජාල පිටු නිර්මාණය පිළිබඳ විශේෂඥයකු වන අතර ඔහු අන්තර්ජාලයට තදින් ඇබ්බැහි වූවකු ද වේ. අවිවාහකයකු ලෙස ඔහු ඉතා නිහඬ ජීවිතයක් ගත කරයි. එක් දිනක් ඔහු ඉතා පුදුම සහගත දැන්වීමක් ඔහුගේ පුද්ගලික අන්තර්ජාල පිටුවේ පළ කළේය. ඒ අනුව ස්වේච්ඡාවෙන් තමාව ඝාතනය කොට එම මස් අනුභව කරන්නට කැමති කෙනෙකු සිටී නම් ඔහුව අමතන ලෙස මෙම දැන්වීම තුළින් ඔහු ඉල්ලා සිටියේ ය.

ඇමෙරිකානු වැසියකු වන ෆිලිප් මහතා මෙම දැන්වීම දුටු අතර ඔහු හෙන්කල් මහතාට පිළිතුරු යවමින් දන්වා සිටියේ තමා හෙන්කල් මහතා අතින් ඝාතනය කර එම මස් අනුභව කිරීම සඳහා ලබාදීමට කැමති බවයි. මින් උද්දාමයට පත් වූ හෙන්කල් මහතා ෆිලිප් මහතා සමඟ ඊ-මේල් කිහිපයක් හුවමාරු කරගත් අතර, පසුව ඔහුට ලංකාවට පැමිණීම සඳහා අවශ්‍ය වීසා බලපත්‍ර හා ගුවන් ටිකට් පත් ද පිළියෙල කළේය.

මොහු පැමිණෙන දින, හෙන්කල් මහතා ෆිලිප් මහතා පිළිගැනීම සඳහා ගුවන් තොටුපලට ගිය අතර පසුව ලංකාවේ කළුකර පළාතේ පාළු ස්ථානයක පිහිටි ඔහුගේ නිවසට ෆිලිප් මහතා කැටුව පැමිණියේ ය. ඔවුන් දින දෙකක් මත්ද්‍රව්‍ය බොමින් සහ ලිංගික ක්‍රියාවල යෙදෙමින් සිටි අතර තුන්වන දින ෆිලිප් මහතා හෙන්කල් මහතාගෙන් තමාගේ ආශාව ඉෂ්ඨ කරන ලෙස ඉල්ලා සිටියේ ය. ඔහු තවදුරටත් කියා සිටියේ මෙපමණ දුරක් ඇමෙරිකාවේ සිට ලංකාවට පැමිණියේ තමාගේ උපන් ආශාව මුදුන්පත් කර ගැනීම සඳහා බවයි.

හෙන්කල් මහතා මේවන විට ඝාතනය කිරීමට තමා තුළ ඇතිවූ අදහස සම්පූර්ණයෙන්ම අත්හැර තිබුණද ෆිලිප් මහතාගේ නැවත නැවත කරන ලද ඉල්ලීම් මත ඔහු ක්‍රියාත්මක විය. හෙන්කල් මහතා පාන් කපන පිහිය ගෙන ෆිලිප් මහතාගේ බෙල්ල කැපූ අතර පසුව සිහිසන්වූ ඔහුගේ ශරීරය ටික වේලාවක් ඇඳ මත තිබෙන්නට හැරියේ ය. පසුව ඔහු ෆිලිප් මහතාගේ හිස හා අත්පා වෙන් කළ අතර, ඒවා අධිශීතකරණයේ

තැන්පත් කළේය. පසුව ඔහු මෙම මනුෂ්‍ය මාංශ උපයෝගී කර ගෙන ආහාර පිළියෙල කොට ඒවා වයින් සහ අර්තාපල් පෙති සමග අනුභව කළේය.

ප්‍රදේශයේ පොලීසියට ලැබුණු ඔත්තුවක් මත නිවස පරීක්ෂා කළ අතර, කපා ඉවත් කරන ලද ශරීර කොටස් අධිශීතකරණයේ තිබී පොලීසිය සොයා ගත්තේ ය. හෙන්කල් මහතාට මනුෂ්‍ය ඝාතනයට එරෙහිව චෝදනා නඟා ඇති අතර ඔහු එම චෝදනාව ප්‍රතික්ෂේප කරමින් කියා සිටින්නේ මිනිස් මාංශ අනුභව කිරීම ශ්‍රී ලංකා නීතිය යටතේ තහනම් කර නැති බවයි. තවදුරටත් ඔහු කියා සිටින්නේ ෆිලිප් මහතා ස්වේච්ඡාවෙන් ඝාතනය කොට අනුභව කිරීම සඳහා ඉදිරිපත් වූ බවත් තමා ක්‍රියා කළේ සද්භාවයෙන් බවයි. තවද ඔහු කියා සිටින්නේ සදෝෂී මනස නොමැතිවීම ශ්‍රී ලංකා නීතිය යටතේ අපරාධ වගකීමට එරෙහි යොදාගත හැකි විත්තිවාචකයක් බවයි.

සාකච්ඡා කරන්න.

02. මුද්‍රණ ව්‍යාපාරයේ නියැලී සිටින "සොෆ්ට් ප්‍රින්ටින් පුද්ගලික සමාගම" නැමැති ආයතනයේ හිමිකරු රණබාහු මහතා ය. එක් දිනක් ඔහු මධ්‍යම රාත්‍රිය වනතුරු වැඩ කරමින් සිටියේ පසුදිනට බෙදාහැරිය යුතු ඇණවුමක් තිබූ බැවිනි. මධ්‍යම රාත්‍රී 12.30 ට පමණ නොදන්නා පුද්ගලයකු දුරකථනයෙන් ඔහුට කථා කළ අතර රුපියල් 50,000/- ක් ඉල්ලා සිටියේ ය. මෙම නාඳුනන පුද්ගලයා තර්ජනය කරමින් කියා සිටියේ මෙම ඉල්ලීම ඉටු නොකළහොත් ඔහුගේ බිරිඳ සහ ළමයා තමාගේ කණ්ඩායම විසින් අපහරණය කරනු ඇති බවයි.

තම පවුලට මහත්සේ ආදරය කළ රණබාහු මහතා තම බිරිඳ සහ ළමයාගේ ජීවිතවලට අනතුරක් වේයැයි බියෙන් එම මුදල දීමට පොරොන්දු වූ අතර මුදල් රැගෙන යැමට යමෙකු එවන ලෙස ඔහු නාඳුනන දුරකථන ඇමැතුම්කරුගෙන් ඉල්ලා සිටියේ ය. මඳ වේලාවකට පසුව, වෙස් මුහුණක් පැළඳගත් පුද්ගලයෙකු තමාගේ කාමරයේ දොර අභියස පෙනී සිටි අතර රණබාහු මහතා ඔහුට රුපියල් 50,000/- භාර දුන්නේ ය.

සාකච්ඡා කරන්න.

03. ධනසිරි මහතා 'වානිජ බැංකු පුද්ගලික' සමාගමෙහි කණිෂ්ඨ බැංකු විධායක නිළධාරියෙකු ලෙස සේවය කරයි. ඔහුගේ ප්‍රධාන රාජකාරීන් වන්නේ, ගණුදෙනුකරුවන් ගේ තැන්පත් මුදල් භාර ගැනීම සහ ඒවා ඔවුන්ගේ පුද්ගලික ගිණුම්වලට තැන්පත් කිරීම, මුදල් ආපසු ගැනීම අනුමත කිරීම සහ චෙක් පත්‍ර නිශ්කාෂණය කිරීම යි.

LIBRARY

"වානිජ බැංකුව" මෑතකදී ඉලෙක්ට්‍රොනික බැංකු ක්‍රමය හඳුන්වා දුන් අතර එය වඩා ආරක්ෂා සහිත සහ ගණුදෙනු කරුවන්ට හා බැංකු කාර්යය මණ්ඩලයට ද වඩාත් පහසු වූ එකක් විය. මෙම නව පහසුකම යටතේ ගණුදෙනුකරුවන්ට දවසේ ඕනෑම වේලාවකදී මුදල් තැන්පත් කිරීමට හා ආපසු ගැනීමට හැකි වේ.

ධනසිරි මහතාගේ පත්වීමේ ලිපියෙහි කොන්දේසි කිහිපයක් අඩංගු වන අතර ඒවා කඩකලවිට, එය අපරාධයක් බවද එහි සඳහන් වේ. ප්‍රධාන කොන්දේසි වූයේ, ඔහුගේ නමින් බැංකුවේ කිසිදු ගිණුමක් විවෘත කළ නොහැකි අතර ඔහුගේ ළඟ ඥාතියෙකු එවැනි යම් ගිණුමක් විවෘත කිරීමට අපේක්ෂා කරයි නම්, ඔහු එම ඥාති සම්බන්ධතාවය හා අනෙකුත් කරුණු බැංකු නිළධාරීන්ට ලිඛිතව හෙළිකළ යුතුය.

ධනසිරි මහතාගේ සහෝදරියක වන ධනංජනී මහත්මිය "වානිජ බැංකුවේ" ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කළ අතර ධනසිරි මහතා මේ ගැන බැංකු නිලධාරීන්ට හෙළි නොකළේ ය. පසුව ධනසිරි මහතා බැංකුවට අයත් රු- 50,000/- ක මුදලක් තම සහෝදරියගේ ඉතිරි කිරීමේ ගිණුමට ඉලෙක්ට්‍රොනික ක්‍රමයෙන් මාරු කළේය.

දණ්ඩ නීති සංග්‍රහයේ 366 සහ 367 යන වගන්ති යටතේ සොරකම සඳහා ධනසිරි මහතාට එරෙහිව දැන් චෝදනා නඟා ඇත.

ඉහත සඳහන් කරුණු යටතේ මෙම චෝදනාව ධනසිරි මහතාට එරෙහිව ඔප්පු කළ හැකි දැයි බැංකු නිළධාරීන් ඔබගෙන් උපදෙස් පතන අතර එසේ ඔප්පු කළ නොහැකි නම් ඔහුට විරුද්ධව සාර්ථකව අධි චෝදනා ඉදිරිපත් කළ හැක්කේ කුමන අපරාධයකටදැයි ඔබගෙන් කරුණු විමසයි.

බැංකු නිළධාරීන්ට උපදෙස් දෙන්න.

04. මුතාලිෆ් මහතා මෑතකදී විශ්‍රාම ගිය පොලිස් නිළධාරියෙකි. ඔහු රටපුරා පිහිටා ඇති පොලිස් ස්ථාන කිහිපයක සේවය කර ඇති අතර නීතිගරුක නිළධාරියෙකු ලෙස හා අතරත් ජනප්‍රිය වී ඇත. එහෙත් ඔහුගේ අසල්වැසියා වන සිවා මහතා ඔවුන්ගේ ඉඩම වෙන් කරන කම්බි වැට සම්බන්ධයෙන් ඇති වූ බහින්බස් වීමක් හේතුවෙන් මුතාලිෆ් මහතා සමඟ අමනාප වී ඇත.

දිනක් කම්බි වැටේ කොටසක් කැඩී ඇති බව මුතාලිෆ් මහතා දුටු අතර එය සිවා මහතා විසින් කරන්නට ඇතැයි මුතාලිෆ් මහතා සිතුවේ ය. මෙයින් කෝපයට පත්වූ මුතාලිෆ් මහතා ඒ ගැන සිවා මහතාගෙන් ප්‍රශ්න කළේය. එම අවස්ථාවේදී සිවා මහතා "උඹ නාකි කොස්සා, මම උඹට භය නැහැ" යනුවෙන් පවසමින් මුතාලිෆ් මහතා ප්‍රකෝප කළේය. මෙම ප්‍රකෝපකාරී වචන ඇසීමෙන් මුතාලිෆ් මහතාගේ ආත්ම සංයමය

4633

LIBRARY



නැතිවූ අතර ඔහු ඉනේ සඟවාගෙන සිටි පිස්තෝලයෙන් වෙඩි තැබුවේ ය. සිවා මහතා එම අවස්ථාවේදීම මිය ගියේ ය.

පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ අධිකරණ වෛද්‍ය විශේෂඥවරයා සිය වාර්තාවේ සඳහන් කර ඇත්තේ මිය ගිය පුද්ගලයාගේ හිසෙහි සහ කඳෙහි ගිනි අවියකින් කරන ලද බහුවිධ තුවාල දක්නට ලැබෙන බවයි. තවදුරටත් වාර්තාව සඳහන් කරන පරිදි එක් උණ්ඩයක් මොළය ඇතුලට ගොස් තිබූ අතර එය ක්ෂණික මරණය ඇති කිරීමට තරම් මාරාන්තික තුවාලයක් බවයි.

සාකච්ඡා කරන්න.

05. ළදරුහාවය පිළිබඳ විත්තිවාචකය දණ්ඩනීති සංග්‍රහයේ අදාල විධිවිධාන ඇසුරෙන් සාකච්ඡා කරන්න.

06. සිරිමල් වයස අවුරුදු 19 ක් වන විවෘත විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන නීති ශිෂ්‍යයෙකි. ඔහුට රන්මලී විශ්වවිද්‍යාලයේදී මුණ ගැසුණු අතර සුළු කාලයකින් දෙදෙනා ආදරවන්තයින් බවට පත්විය. ඔවුන් දෙදෙනාගේම කණ්ඩායම් සඟයින් අතර ප්‍රසිද්ධ කරුණක් වූයේ රන්මලී ඉතා දැඩි ලෙස සිරිමල් සමග ආදරයෙන් බැඳී සිටින බවයි. දෙපාර්ශ්වයේම දෙමාපියන් මෙම සම්බන්ධය පිළිබඳව දැන සිටි අතර විශේෂයෙන්ම රන්මලීගේ දෙමාපියන් දෙදෙනාම ආශීර්වාද කළහ. අසල පිහිටා ඇති පීසා කඩයක අර්ධ කාලීනව රැකියාවක් කරන සිරිමල් සිය වැටුප සම්පූර්ණයෙන්ම රන්මලීට තෑගි මිළදී ගැනීම සඳහා වැය කරයි.

එක් දිනක් තම දෙමාපියන් නිවාඩුවක් ගත කිරීම සඳහා නිවසින් බැහැරට ගොස් සිටි අවස්ථාවක රන්මලී සිරිමල්ට තම නිවසට පැමිණෙන ලෙස ආරාධනා කළා ය. සිරිමල් රන්මලී සමඟ රාත්‍රිය ගත කළ අතර රන්මලීගේ ඉල්ලීම මත ලිංගිකව හැසිරුනේ ය.

රන්මලීගේ දෙමාපියන් නැවත පැමිණි විට සිරිමල් රාත්‍රී නිවසේ ගත කළ බව දැනගත් අතර ඉන් අතිශයින්ම කෝපයට පත් වූ රන්මලීගේ පියා ප්‍රදේශයේ පොලිස් ස්ථානයට ගොස් රන්මලී දූෂණය කර ඇතැයි සිරිමල්ට එරෙහිව පැමිණිල්ලක් ගොනු කළේය. පොලිසිය වහාම වෛද්‍ය පරීක්ෂණයක් සූදානම් කළේය. වෛද්‍ය වාර්තාවේ දැක්වෙන්නේ යෝනි මුඛය තුළ හෝ අවට කිසිදු සීරීමක්, තැලීමක් හෝ ඉරීමක් නොමැති බවයි. තවදුරටත් එම වාර්තාවේ දැක්වෙන්නේ ස්ත්‍රී ලිංගයේ භාහිර ස්ථරයේ **(labia majora)** ශුක්‍රානු පැල්ලම් දක්නට හැකි වුවත් කන්‍යා පටලයට හානියක් සිදුවී නොමැති බවයි.

සිරිමල් ඔබගේ උපදෙස් අපේක්ෂා කරයි.
සිරිමල්ට උපදෙස් දෙන්න.

07. "සාක්ෂි යනු අධිකරණය හමුවේ යම් ඉසව් ගත කරුණක් ඔප්පු කිරීමට හෝ ඔප්පු නොකිරීමට භාවිතා කරන ක්‍රමෝපායන් ය."

ඉහත ප්‍රකාශය හා අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් සාක්ෂි වර්ග මොනවාදැයි සාකච්ඡා කරන්න.

ඔබගේ පිළිතුර විනිශ්චිත නඩු මගින් පහදන්න.

08. පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම දෙකක් සම්බන්ධයෙන් කෙටි සටහන් ලියන්න.

(අ) සාපරාධී අයුතු පරිහරණය
(ආ) විත්තිවාචකයක් ලෙස කැමැත්ත
(ඇ) උමතුභාවය
(ඈ) කාරණත්වය

- හිමිකම් ඇවිරිණි.-